ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 10 | විෂයය Subject } සිංහල | පත්‍රය Paper } III | කාලය Time } පැය 02 |

නම :- ..........................................................................................  පංතිය :- ...........................

සැලකිය යුතුයි :-

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- (i) සිට (x) තෙක් ඇති සිලුම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය යොදා ඉදිරියෙන් ඉරක් අඳින්න.

---

01

I. (අ) උම්මග්ග ජාතකයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ කුමක් ද?

(ආ) සිංහල ජාතක කථාව තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුන නම් කරන්න.

II. එසේ කල්හි නුඹ වහන්සේ සියලු දඹදිවට අග රජ වන සේක.

(අ) මෙසේ කිව්වේ කවුරුන් විසින් කාහටද?

(ආ) මෙම කෘතිය ලියවුණු යුගය කුමක් ද?

III. "මමත් මහා නුවණැත්තෙක්මි" එක් ලෙසකින් ඔහු පරදවා පියම්හ" යි කීහ.

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?

(ආ) "එක් ලෙසකින්" යන්නෙන් අදහස් කළේ කුමක් ද?

IV. "සබඳ තොප විසින් කුමක් දක්නා ලද ද"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙහි "සබඳ" යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?

V. (අ) පන්සිය පනස් ජාතක පොත රචනා කිරීමට මූලික වූ ග්‍රන්ථය කුමක් ද?

(ආ) පන්සිය පනස් ජාතක පොත රචනා කිරීමට අනුග්‍රහය දක්වූ අමාත්‍යවරයා කවුද?

VI. "නෙබව මැනව දේවියන් වහන්ස රාජ්‍යසුව අනුභව කල මැනව"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කලේ කවුද?

VII. (අ) ජාතක කතා ඇසුරකොට ගෙන ලියැවුනු ගී කාව්‍ය 2ක් ලියන්න.

(ආ) ජාතක පොත රචනා කළ අවධියේ සිටි රජු කවුද?

VIII. (අ) ගුත්තිල කාව්‍ය රචනා කළ යුගය කුමක් ද?

(ආ) එහි ඇති පද්‍ය ගණන කීයද?

IX. (අ) ගුත්තිල කාව්‍ය රචනා කළේ කවුරුන් විසින් ද?

(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුද?

X. (අ) ගුත්තිල කාව්‍ය රචිත වැත්තෑවේ හිමියන්ගේ ගම් ප්‍රදේශය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ආ) ගුත්තිල කාව්‍ය නිර්මාණය කිරීමට හේතු වූ කරුණු කෙටියෙන් දක්වන්න.

(ලකුණු 2 × 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(I) **"සාල්ලෙක ලාලා"** පාතට බානා කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිස වර්චස් පිඬක් හෙළා, කිමෙක් දැයි **කට දල්වාගෙන** උඩ බැලූ තැනැත්තාවුන් ගේ මුඛයේ නැවත වර්චස් පිඬක් හෙළා" ....

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මුළු කොටසේම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(II) "දේවියන් වහන්ස සෘද්ධිමත් කෙනෙකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුතු මිනිසුන් විසින් මේ නුවර වඳනා තබා සිතන්නටත් බැරිය" ....

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?

(ආ) මේ හා බැඳුනු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(III) ගුත්තිල මහා **සිරි**

සක් දෙව් බසින් සැතපී

………………………………

බඹර තත පළමුවෙන් සිදපී

(අ) ඉහත කවියේ කවි පදය සම්පූර්ණ කරන්න.

(ආ) කවියේ තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය දක්වන්න.

(IV) "**පන් සිළු**" වීනා නද පසු බැස්වූ

මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ

"**නන් දන**" කැන් දුටුවද බිය සිස්වූ

මින් රළ වුත් ගං වෙරළට රැස්වූ

(අ) ඉහත පද්‍යයේ තද කළු අකුරින් දක්වා ඇති පදවල අර්ථය ලියා දක්වන්න.

(ආ) කවියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

(V) "දරුව මසු දහස තොපට අභිප්‍රාය දැයි" විචාරා "එසේ කැමැත්තෙමි" කී කල...

(අ) මෙහි "අභිප්‍රාය" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) මින් පසු සිදුවීම පේළි දෙකකින් දක්වන්න.

03. වෛදේහ රජතුමාගේ මියුලු නුවර රාජධානිය සතුරනට අත්පත් කර ගැනීමට නොහැකි වූයේ එය මහෞෂධ පඬිතුමා විසින්,

(අ) සුරක්ෂිතව ගොඩනඟා තිබීමත්

(ආ) සූක්ෂම වූ චර පුරුෂ සේවයන් නිසාය.

සතරකන් මන්ත්‍රණය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්,

(i) මිනිසුන් ද

(ii) සතුන් ද

අකර්මණ්‍ය කිරීමට සමත් වූ අයුරු නිදසුන් දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

04. සතරකන් මන්ත්‍රණයයෙහි එන මහෞෂධ පඬිතුමා හා කේවට්ට පණ්ඩිතයන් අතර ඇති,

(i) සමානත් දෙකක් ද,

(ii) විෂමතා දෙකක් ද

නිර්දිෂ්ඨ කොටස් ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න

නැතහොත්,

ගුත්තිල කාව්‍ය සාර්ථකත්වයට බලපා ඇත්තේ,

(i) අවස්ථාවට ගැලපෙන ලෙස චරිත වෙනස් කිරීමට කතෘවරයාට තිබූ දක්ෂතාවය,

(ii) වර්තමාන සරල බස් වහර යොදා ගැනීම යන කරුණු හේතුවෙනි. එක් කරුණකට නිදසුන් අවස්ථා දෙක බැගින් දක්වමින් නිර්දිෂ්ඨ කොටසින් උදාහරණ සපයා පැහැදිලි කරන්න.

05. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපයා කෞශල්‍යය හේතුවෙන් .... රාජ්‍ය ආරක්ෂා වූ අයුරු නිදසුන් තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න.

06. හාස්‍යය හා උපහාසය පෙරදැරිව කේවට්ට බමුණගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම සතරකන් මන්ත්‍රණය පාඩම ආශ්‍රයෙන් විමසන්න.

07. "ගුත්තිල ඇඳුරුතුමාගේ වීණා නාදයේ මිහිරියාව වඩාත් හොඳින් ධ්වනිතාර්ථවත් වන්නේ අවට රැස් වූ පිරිසගේ ස්භාවය වර්ණනා කිරීම නිසාය" උදාහරණ තුනක් වත් සපයා මෙම ප්‍රකාශය සනාථ කරන්න.